# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1960/11 - 2016 මාර්තු මස 29 වැනි අඟහරුවාදා - 2016.03.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xiv).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20 (4) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 (4) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ශ්‍රී ලංකාවේ, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කටයුතුවල පරිපාලනය යථා තත්ත්වයට පත්ව ඇති බවට සෑහීමකට පත් වීමෙන් පසු මෙම නියමය මගින්, ශ්‍රී ලංකාවේ, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය උමා කුමාරස්වාමි. පත් කරමින් මා විසින් කරන ලදුව, 2015 දෙසැම්බර් මස 30 වැනි දින සහ අංක 1947/25 දරන රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, 2016 ජනවාරි මස 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

04 - 551


1A - PG 2904 — 507 (2016/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*